**දොම්පෙ ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

දොම්පෙ ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වටිනාකම රු.850,554 ක්වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට පරිත්‍යාග ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, එම වටිනාකමට අදාලව ක්‍රමක්ෂය වටිනාකම පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් ලෙස රු.95,410 ක් ප්‍රවර්තන වර්ෂයේදී හඳුනා ගෙන නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් වර්ෂයේ අතිරික්තය අඩුවෙන් ද ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය වැඩියෙන්ද ගිණුම් ගතකර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

(ආ) 2021 වර්ෂය තුල ලැබුන රු.40,940,885 ක් වූ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) මෝටර් වාහන යටතේ ගිණුම්ගත කළ යුතු රු.6,187,290 ක් වටිනා ට්‍රැක්ටර් 09 ක්, යන්ත්‍ර යටතේ ගිණුම්ගතකර තිබුණි. තවද, ට්‍රැක්ටර් 9 හි ක්ෂය වටිනාකම මෝටර් වාහන ක්ෂය ප්‍රතිශතය යටතේ රු.247,492 ක් විය යුතු වුවත්, යන්ත්‍ර ක්ෂය ප්‍රතිශතය යටතේ රු.309,365 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය සහ දේපළ, පිරියත හා උපකරණ ශේෂය රු. 61,873ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වේ.

(ඈ ) සමාලෝචිත වර්ෂයේ මුදලට මිලදී ගන්නා ලද ගබඩා තොග වටිනාකම රු.19,556,553 ක් අදාල සැපයුම් වියදම් ගිණුමට හර කර ණය හිමි ගිණුම් බැර කර තිබුණි. මෙම ගබඩා තොග ගැනුම් වටිනාකම පොදු ගබඩා ගිණුම හර කර සැපයුම් වියදම් ගිණුම බැර කිරීමේ දී රු.27,897,146 ක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල් ශේෂය සහ පොදු ගබඩා ශේෂය රු.8,340,593 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වේ.

(ඉ ) සමාලෝචිත වර්ෂය තුලදී දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවන ලද රු. 443,752ක් වියදම් ගිණුම් හර කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එසේම පෙර වර්ෂවලද මෙම ණය වාරික අදාල වර්ෂවල වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන්, රු.2,315,856 ක් සමුච්චිත අරමුදල් ශේෂය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු බව නිරීක්ෂණය විය.

(උ) සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු පොළිය විගණනයේ ගණනය කිරීම් අනුව රු.9,155,612 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.14,353,032 ක් වූයෙන් රු.5,197,420 ක් වර්ෂයේ අතිරික්තය සහ ලැබියයුතු පොළිය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) 2019 වර්ෂයේ ආදායම් වර්ග 15 ක ගිණුමේ ශේෂය නිවැරදි ශේෂයට වඩා වැඩිවීම් හා වටිනාකම රු.99,962,724 ක් එක් එක් හිඟ හිටි ආදායම් ගිණුම් වලට බැර කරනු වෙනුවට සංචිත හා වෙන්කිරීම් බැර කර තිබුණි.

2022.12.31 ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරනු ලැබේ.

නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| (එ) | පළාත්පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයේ 15.8 අනුව ඉදිරි වර්ෂය තුල දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.443,752 ක ණය වාරිකය ජංගම වගකීම් ලෙසට වෙන්කර දක්වා නොතිබුණි. | 2022.12.31 වාර්තාවෙන් කරනු ලැබේ. | ගිණුම් නිවැරදිව ගිණුම්ගත නිවැරදි කළ යුතුය. |

1.6.2.**ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ණය හිමි කාල විශ්ලේෂණය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් දිනට වසර 3-5 ත් අතර කාල පරාසයක නොගෙවන ලද රු.731,002 ක් සහ වසර 1-3 ත් අතර කාලයක සිට නොගෙවන ලද රු.4,873,735 ක් 2022 ජුනි 30 දින වනවිටත් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. | වසර 1-3 අතර මුදල් ඉදිරියේදී ආදායමට ගැනීමට හෝ ගෙවා දැමීමට කටයුතු කරමි. වසර 3-5 අතර රු.731,002 ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් වෙතින් මුදල් ලැබුණ පසු නිරවුල් කෙරේ. | ණය හිමි ශේෂ පරීක්ෂාකර ගෙවියයුතු ශේෂ ගෙවීමටත්, ගිණුම්කරණ දෝෂ නිවැරැදි කිරීමටත් කටයුතු කළයුතුය. |
| (ආ) | සභාව සතු දේපල බදු දීමෙන් 2021 දෙසැම්බර් 31 දිනට හිග බදුකර කුලී ආදායම රු.11,973,953 ක් වී තිබුණි. කාල විශ්ලේෂණය අනුව එයින් හිහව පැවති කාලය වසරකට වැඩි වටිනාකම රු.654,658 ක්ද , මාස 01 ත් මාස 09 ත් අතර වටිනාකම රු.7,021,565 ක් ද 2022 ජුනි 30 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිග මුදල් අය කර ගැනීමට ලිපි යවා ඇත. | හිගහිටි ආදායම් අයකර ගැනීමට කටයුතු කලයුතුය |

1.6.3. **නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා_**

----------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය හා උපලේඛනය අනුව ශේෂය අතර රු.4,316,967ක වෙනසක් විය. | 2022 දෙසැම්බර් 31 ගිණුමෙන් නිවැරදි කරනු ලැබේ. | වෙනස් කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

1.7. **අනුකූල නොවීම්**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (අ) 371(2) | 2008 වර්ෂයේ සිට පැවත එන අදාළ පාර්ශ්වයන් හඳුනාගෙන නොමැති රු.82,656 ක අත්තිකාරම් සහ 2021 වර්ෂය තුල ලබාදෙන ලද රු..880,389 ක්වූ අත්තිකාරම් 2022ජුනි 30 දින වනවිටත් පියවා නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නොපියවන ලද අත්තිකාරම් මුදල් අය කර ගත යුතුය. . |
| (ආ) 571 | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කල් ඉකුත් වූ ගිවිසුම් ඇප, ටෙන්ඩර් තැන්පතු, සියයට දහයේ කොන්ත්‍රාත් තැන්පතු සහ විවිධ තැන්පතු එකතු වටිනාකම රු.2,069,790 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව රාජ්‍ය ආදායමට ගැනීමට හෝ ආපසු ගෙවා දැමීමට කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.49,034,331 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.187,187,134 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතු කිරිදිවැල පොදු වෙළඳපල කඩ කාමර කුලියට දීම සම්බන්ධයෙන් බදුකරුවන් සමග ඇතිකරගත් ගිවිසුමේ 4 වන කොන්දේසිය ප්‍රකාරව බදු කුලිය මාස 03කට අධික කාලයක් ප්‍රමාද කළ නොහැකි අතර එසේ කලහොත් දේපල මුද්‍රා තබා පවරාගත යුතු වුවත් කඩ කාමර 04 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණු අතර ඒවායේ 2021 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා හිඟ හිටි බදු කුලිය රු.393,400 ක් වී තිබුණි. | මුදල් නොගෙවන ලද කඩ කාමර වෙනුවෙන් අවසාන නිවේදන යවා ඇති අතර නීත්‍යානුකූල පියවර ගන්නා බව දන්වා සිටිමි. | ගිවිසුමේ කොන්දේසිය ප්‍රකාරව පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. |

3.2. **වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම | | |
| | සභාව සතුව පැවති විශාලත්වය අක්කර 110.92 ක් වූ වටිනාකම රු.520,182,000 ක් වූ ඉඩම් සඳහා හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | හිමිකම් ඔප්පු නොමැති ඉඩම් සම්බන්ධයෙන් මේ වන විට කටයුතු කරගෙන යනු ලබයි. | හිමිකම් ඔප්පු ලබාගත යුතුය. |
| (ආ) | නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම් | | |
| | ධාවනයෙන් ඉවත් කරන ලද එකතු වටිනාකම රු.1,694,562 ක් වූ ට්‍රැක්ටර් 02 ක් සහ අත්ට්‍රැක්ටරයක්ද, වටිනාකම සඳහන් නොවූ ගලි බවුසරයක් සහ ට්‍රැක්ටරයක්ද, අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ තක්සේරු කර විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු නොකර නිෂ්ක්‍රියව පැවතුණි | 2022 වර්ෂය අවසන් වනවිට වෙන්දේසි කිරීමට කටයුතු කරමි. | වටිනාකම සඳහන් නොවූ වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමටත් අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ තක්සේරු කර විධිමත් ලෙස අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.3. පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම පරිසර අධිකාරිය සමඟ දොම්පෙ ප්‍රාදේශීය සභාව විසින් 2010 අගෝස්තු 03 දින අත්සන්කර තිබුණ ගිවිසුම අනුව දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජනනය වන කසල සඳහා අක්කර 12 රූඩ් 1 පර්චස් 16.84 ක්වූ ඉඩමක රු. මිලියන 450 කට ආසන්න මූල්‍යමය පිරිවැයක් දරා කසල බැහැරකිරීම සඳහා සනීපාරක්ෂක කසල රදවන ව්‍යාපෘතියක් කිරිඳිවැල මාලිගාවත්ත ප්‍රදේශයේ ඉදිකර තිබුණි. ගිවිසුමෙ 1.5 කොන්දේසිය අනුව සියළු ඉදිකිරීම් කටයුතු නිම කිරීමෙන් පසු ව්‍යාපෘති භූමිය හා සියළු ඉදිකිරීම් දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත විධිමත්ව පවරා දීමට කටයුතු කළයුතු බව සඳහන් වුවත්, මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂය අවසානය වන විට ඉදිකිරීම් අවසන් ව තිබුණද, 2022 ජූනි 30 දින වනවිටත් එලෙස පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | පරිසර අධිකාරියේ සහ පළාත් සභාව පළාත් ආණ්ඩුකාරතුමා වැනි නිලධාරීන් ලිඛිතව හා වාචිකව දැනුවත් කර ඇති අතර මෙතෙක් සාධනීය විසඳුමක් ලැබී නොමැත.<br>මෙම ව්‍යාපෘතිය දැනට ලංකාවේ එකම ව්‍යාපෘතිය වන අතර නියමු ව්‍යාපෘතියක් සහ අධ්‍යන කේන්ද්‍රයක් වශයෙන් භාවිතා කරනු ලැබීම සභාව වෙත නොපැවරීම හේතුව යැයි හැගේ. | ගිවිසුම අනුව දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත විධිමත්ව පවරාගත යුතුය. |